# එක්සත් ජනපදයේ මිලේනියම් චැලේන්ජ් කෝපරේෂන් ආයතනය ශ්‍රී ලංකාවේ සංයුක්ත සංවර්ධනය ව්‍යාපෘතීන් වැඩිදියුණු කිරීම සඳහා රුපියල් බිලියන 1.1 ක් ලබාදේ

**ජූලි 27 වැනි දා කොළඹදීය** එක්සත් ජනපද රජයේ මිලේනියම් චැලේන්ජ් කොපරේෂන් හි විශේෂ නියෝජිතයින් පිරිසක් අද දිනයේ කොළඹ නගරයේ සංචාරයක නියැලෙති. මිලේනියම් චැලෙන්ජ් කම්පැක්ට් යනු දරිද්‍රතාවය අවම කිරීම සහ ශ්‍රී ලාංකිකයින්ට නව ආර්ථික අවස්ථාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය සමග එක්ව ක්‍රියාත්මක කරනු ලබන පස් අවුරුදු අරමුදල් සැපයීමේ වැඩසටහනකි. මෙම දූත පිරිසේ නායකත්වය දරන්නේ මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන්හි යුරෝපා, ආසියා, පැසිෆික් සහ ලතින් ඇමෙරිකා කලාපයේ රටවල් සඳහා වූ නියෝජ්‍ය උපසභාපති ෆැටේමා එස් සුමාර් වන අතර ඔවුහු මෙම සංචාරයේදී මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය තවදුරටත් ඉහළ නැංවිය හැකි අයුරු පිළිබඳව විමසීමට ලක් කරති.

මෙම සංචාරට අතරතුරේදී මිලේනියම් චැලෙන්ජ් කම්පැක්ට් (MCC) නියෝජිතයින් එක්සත් ජනපද රජයෙන් සැපයෙන නව ආධාර ව්‍යාපෘති පිළිබඳව දැනුම් දීමට නියමිතය.

"මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් ශ්‍රී ලංකාවේ නව ආයෝජන සිදුකළහැකි විශේෂ ව්‍යාපෘතීන් හඳුනාගැනීමත් ඒවා විශ්ලේෂණය කිරීමත් ඇතුළත්ව ශ්‍රී ලංකා රුපියල් බිලියන 1.1 මුදලක් (ඇ එ ජ ඩොලර් මිලියන 7.4 ක්) සංයුක්ත සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබාදෙන බව අපි ඉතා සතුටින් දැනුම් දෙනවා" යැයි සුමාර් පැවසීය.

මෙම සංයුක්ත අරමුදල තවමත් වර්ධනය වෙමින් පවතින බැවින් සම්පූර්ණ සංයුක්ත අරමුදල් ප්‍රමාණය කොතරම් වේ දැයි තවමත් තීරණය කර නැත. ඩොලර් මිලියන 7.4 ආධාර ලබාදෙන්නේ MCC විසින් සපයනු ලබන සම්පූර්ණ අරමුදල් ප්‍රමාණයට අමතරවය.

ආර්ථික වර්ධනයට පවත්නා බාධාවන් පිළිබඳ විශ්ලේෂණයන් පදනම් කර ගනිමින් MCC සහ ශ්‍රී ලංකා රජය ප්‍රවාහන සහ ඉඩම් ක්ෂේත්‍රයන්හි සිදුකළ හැකි ව්‍යාපෘතීන් පිළිබඳව තම අවධානය යොමු කරමින් සිටී.

මෙම සංයුක්ත අරමුදල් සම්බන්ධයෙන් මිලේනියම් චැලේන්ජ් කෝපරේෂන් ආයතනය සමගින් වැඩකටයුතු කිරීමට ශ්‍රී ලංකාවේ රජය "ශ්‍රී ලංකා සංයුක්ත සංවර්ධන කණ්ඩායම" නමින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් අග්‍රාමාත්‍ය තුමාගේ කාර්යාලයේ ස්ථාපිත කර ඇත. මෙහි අරමුණ වන්නේ ආර්ථික වර්ධනයට දිරිදෙන්නාවූ සහ දරිද්‍රතාවය අවම කරන ආකාරයට ආර්ථික අභියෝගයන්ට විසඳුම් ලබාදෙන ඉහළ ගුණාත්මක තත්වයකින් යුක්ත, සාක්ෂි පදනම් කරගත් සහ තිරසාර සංයුක්ත සංවර්ධන ව්‍යාපෘතීන් සැලසුම් කිරීමයි. ඍජු සුපරීක්ෂණය අධීක්ෂණය හා ඇගයීම් මගින් MCC ආයතනය මෙම ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් පාර්ශවකරණ රටවල් වලට පවත්නා වගවීම තහවුරු කිරීමට කටයුතු කරනු ලබයි.

ශ්‍රී ලංකා සංයුක්ත සංවර්ධන කණ්ඩායම මෙමගින් ප්‍රතිලාභ ලබාගත් හැකි පිරිස්, සිවිල් සංවිධාන පෞද්ගලික අංශය, අරමුදල් සපයන වෙනත් ආයතන සහ රජයේ අදාළ ආයතන ද ඇතුළත්ව විවිධවූ ක්ෂේත්‍රයන්හි පාර්ශවකරුවන් සමගින් උපදේශනාත්මක සාකච්ඡා පවත්වමින් මෙම ව්‍යාපෘතින් සම්බන්ධයෙන් ඔවුන්ගේ අදහස් ලබාගනිමින් සිටී.

2016 දෙසැම්බර් මාසයේදී MCC අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සංයුක්ත සංවර්ධන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකාව තෝරාගන්නා ලදී. MCC හි ප්‍රතිපත්ති ලකුණු පුවරුවේ දර්ශක 20 න් 13 කට ලකුණු ලබාගැනීමෙන් පසුව MCC සහාය ලබාගැනීමට ශ්‍රී ලංකාව සුදුසුකම් ලබාගත්තේය. මෙම සංයුක්ත සංවර්ධන ව්‍යාපෘතීන් අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා MCC අධ්‍යක්ෂක මණ්ඩලය විසින් දෙසැම්බර් මාසයේදී සිදුකරනු ලබන ඇගයීමේදී ශ්‍රී ලංකාව නැවත වතාවක් ඔවුන් විසින් තෝරාගැනීමට ලක්විය යුතුවේ.

MCC පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා www.mcc.gov.වෙබ් අඩවියට පිවිසෙන්න

###